# වන්නි සිංහල ජනයා හා සම්බන්ධ අනන්‍යතා ලක්ෂණ හා ජීවන චර්යා පිළිබඳ මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයක් (කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුකුලෑව ගම ඇසුරිනි)

**සංදීපනි යූ.බී.එම්.**[1]

ශ්‍රී ලංකාවේ පැරණි ජන කොට්ඨාසයක් ලෙස වන්නි සිංහල ජනතාව හඳුනාගත හැකි ය. ගම්වැද්දන් ලෙස ද හඳුන්වන මොවුන් වර්තමාන උතුරු මැද පළාතෙහි ගම්මාන කිහිපයක ම ජීවත් වෙති. එවැනි ගම්මානයක් වන අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කුකුලෑව ගම්මානය ඇසුරින් මෙම අධ්‍යයනය සිදුකරනු ලැබී ය. අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ කුකුලෑව ග්‍රාමයේ ජීවත්වන වන්නි සිංහල ජනයාගේ අනන්‍යතා ලක්ෂණ හා ජීවන චර්යා අධ්‍යයනය කිරීම යි. ඒ සඳහා පුස්තකාල අධ්‍යයනය හා ක්ෂේත්‍ර අධ්‍යයනය මඟින් දත්ත ඒකරාශී කරනු ලැබී ය. මේ අධ්‍යයනය මඟින් කුකුලෑව ගම්මානයේ ජීවත් වන වන්නි සිංහල ජනයාගේ සමාජ, සංස්කෘතික ලක්ෂණ හඳුනාගත හැකි විය. ඔවුන්ගේ ආහාර රටාව, වාසස්ථාන, අභිචාර විධි ආදිය සිංහල ජනතාවට වඩා තරමක් වෙනස් බව හඳුනාගත හැකි විය. සතුන් දඩයම් කිරීම, වන ද්‍රව්‍ය එක්රැස් කිරීම ඔවුන්ගේ ප්‍රධාන ජීවන වෘත්තිය වුවත් වර්තමානය වන විට කෘෂිකර්මාන්තය හා අනෙක් වෘත්තීන් කෙරෙහි අවධානය යොමු කර ඇති බව හඳුනාගත හැකි විය. මහාකැලෑයාම, වන්නි දෙවියන් ඇදහීම වැනි අභිචාර ආවේණික ඒවා වන අතර විවාහ සබඳතා වන්නි සිංහල ජනතාව අතර පමණක් සිදු වේ. නිවාස සකස් කිරීමේ දී මැටි ගෙවල් සකස් කිරීම බහුල ව දක්නට ලැබේ. ප්‍රාථමික ජීවන රටාවක් ඇති වන්නි සිංහලයින් සිංහල ජනතාවගෙන් වෙනස් වන බවත්, ශ්‍රී ලංකාවේ පැරණි ම ජන කොටසක් බවත් දැඩි ව පිළිගැනීම හේතුවෙන් නවීන සමාජයට අනුගත වීමට වන්නි සිංහල වැඩිහිටි ප්‍රජාව අකමැත්තක් දක්වන බවත් පැහැදිලි වේ. නමුත් වර්තමානයේ සිංහල ජනතාව සමඟ විවාහ සබඳතා පැවැත්වීම, විවිධ රැකියාවලට යොමු වීම, අභිචාර විධිවලින් ඈත්වීම, කුඩා මැටි නිවාස වෙනුවට විශාල නිවාස සකස් කිරීම යනාදී ප්‍රවණතා හඳුනාගත හැකි ය. නූතනය වන විට මෙකී ජනයා යම් සංවර්ධිත මට්ටමකට පැමිණ ඇති අතර අතීතයේ පැවති ඔවුන්ට අනන්‍ය වූ ජීවන රටාවෙන් ඈත් වෙමින් පවතින බව පැහැදිලි වේ. සිංහල ජනයාගේ චර්යාවන්ට වඩා වෙනස් ජීවන රටාවකට උරුමකම් ඇති පිරිසක් ලෙස මෙම ජනතාව හඳුනාගත හැකි වේ. සමාජ නවීකරණය තුළ විවිධ වෙනස්වීම්වලට ලක්වුව ද ඔවුන්ගේ අනන්‍යතා යම් පමණකට තවමත් ශේෂ වී පවතී. එම නිසා ශ්‍රී ලංකාවේ පැරණි සමාජය හඳුනා ගැනීමට ඇති එක් සාක්ෂියක් වූ මොවුන් සතු අනන්‍යතා ආරක්ෂා කරගැනීම කාලෝචිත වූවක් බව නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද :** අභිචාර විධි, ජීවන චර්යා, නවීකරණය, වන්නි සිංහල ජනතාව, සංස්කෘතිය

[1]සිංහල අධ්‍යයනාංශය, රුහුණු විශ්වවිද්‍යාලය. madunikasandeepani39@gmail.com